**අනුරාධපුර මහා නගර සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 08 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 31 දිනද නගරාධිපති ඇතුළු සභාව වෙත යවා ඇත.

1.2 ව්‍යාවනය කළ මතය

මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ජා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

1.3 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | 2016 හා 2017 වර්ෂවලට අදාලව ලැබිය යුතු එළදා බදු රු.403,348 ක් සහ සමාලෝචිත වර්ෂයේ එළදා බදු ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | එකඟ වෙමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කර ඉදිරිපත් කරමි. |
| (ii). | 2017 වර්ෂයේ වෙනත් ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති 17 කට අදාලව ගෙවිය යුතු රු.21,801,992 ක මුදල ණය හිමියන් ලෙස දක්වා තිබුණද අදාල මුදල අයකර ගත යුතු පාර්ශ්වයන් හඳුනා ගෙන ණය ගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මුදල් ලැබිය යුතු පාර්ශ්වයන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | එකඟ වෙමි. ණයගැති ශේෂ හඳුනාගෙන ගිණුම් ගත කිරිමට කටයුතු කරමි. |
| (iii). | 2016 හා 2017 වර්ෂවලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු අදායම් නිවැරදිව ගැලපීම් කළයුතු වේ. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (iv). | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.683,087 ක් වූ අයවිය යුතු ණය ශේෂ 14 ක් රජයේ නිලධාරින්ගේ ණය අත්තිකරම් ගිණුමෙන් අත්හැරි තිබුණි. | අත්හැරුණු ණය ශේෂයන්ගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කල යුතු වේ. | මෙම ණය ශේෂ අත්තිකාරම් ගිණුමෙන් අත් හැරී ඇත. උපලේඛන නිවැරදි කර ඉදිරිපත් කරමි. |
| (v). | අනුරාධපුර පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අදාල රු.121,000,000 ක වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී ඉදිකරන ලද රු.18,978,284 ක් වටිනා ගොඩනැගිලි 16 ක් හා සභාව සතු අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | එකඟ වෙමි.<br>මිනුම් කර අවසන් වූ වහාම තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා වාර්තා නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vi). | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු.9,707,000 ක් වටිනා ට්‍රැක්ටර් 03 ක් හා එක්ස්කැවේටර් යන්ත්‍රයක් රු.3,902,700 ක් ලෙස ගිණුම්ගත කර තිබිම නිසා රු.5,804,300 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සියළුම ස්ථාවර වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | ට්‍රැක්ටර් 3 ක් එක්ස්කැවේටර් යන්ත්‍රයක් පමණක් මිළදී ගෙන ඇත. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කළයුතු ජාතික ගොඩනැගීමේ බදු රු.213,084 ක බැරකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගෙවිය යුතුව තිබුණු වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කලයුතු වේ. | එකඟ වෙමි.<br>නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (viii) | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් 2018 දෙසැම්බර් 31දිනට හිලවු කරගත යුතු රු.202,145 ක එකතු කළ අගය මත බදු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එකතු කළ අගය මත බදු නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | එකඟ වෙමි.<br>නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් අතර මුදල් මාරු කිරිම් 04 ක | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | එකඟ වෙමි.<br>අදාළ නිවැරදි කිරිමේ සටහන් යොදා නොපියවූ බැරකම් |

| | | | |
|---|---|---|---|
| | රු.840,421 ක් වූ නොපියවූ බැර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ජංගම බැරකම් ලෙස දක්වා තිබුණි. | | ශේෂය නිරවුල් කිරිමට කටයුතු කරමි. |
| (x). | දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය වාරික කොටස් ගෙවීම් රු.1,060,359 ක් ණය මුදලින් අඩුකර දැක්වීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි. | ණය වාරිකවල ඇතුලත් ප්‍රාග්ධන ගෙවීම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2016 වර්ෂයේ ලෙජරයේ ශේෂ නිවැරදි කර සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම් කිරිමේ දී සිදුවූ වැරදිමකි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 10 ක වටිනාකම් හා ඒවාට අදාල ලේඛනවල දැක්වෙන වටිනාකම් අතර එකතුව රු.21,245,660 ක නොසැසදීමක් විය. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය හා උපලේඛණය අනුව ශේෂය නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත් 05 ක රු.22,899,779 ක් වූ එකතු වටිනාකම එදිනට මූල්‍ය ප්‍රකාශනවල රු.27,394,913 ක් ලෙස දක්වා තිබීම නිසා රු.4,535,136 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ පත්‍ර දිනට මුදල් පොත්වල ශේෂයන් නිවැරදිව දැක්විය යුතුය. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත් 05 ක් ශේෂ කිරිමේදි සිදුවූ වැරදීම් නිවැරදි කර ඇත. |
| (iii). | සමාලෝචිත වර්ෂයේ කසල ගාස්තු ආදායම ලේඛන ප්‍රකාරව රු..4,474,900 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව රු.4,949,864 ක් වුයෙන් රු.474,964 ක වෙනසක් විය. | වර්ෂයට අදාළ ආදායම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | එකඟ වෙමි.<br>ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv). | සමාලෝචිත වර්ෂයේ ගලිබවුසර් ආදායම් ලේඛන අනුව රු.3,672,250 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව රු.7,590,756 ක් වුයෙන් රු.3,918,506 ක වෙනසක් විය. | වර්ෂයට අදාළ ආදායම අනුව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | එකඟ වෙමි. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.462,503,879 ක්වූ ගිණුම් විෂයයන් 13 ක් වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, වයස් විශ්ලේෂණ, තොග ලේඛන, ශේෂ සනාථ කිරීමේ ලිපි, ලැබීම් හා ගෙවීම් ලේඛන, ණය ලේඛන සහ විස්තරාත්මක ලේඛන විගණනයේදි සතුටුදායක ලෙස සංනිරීක්ෂණ/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | සියළුම සාක්ෂි ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කරමි. |
| (ii) | වරිපනම් ආදායමින් පෙර වර්ෂයට අදාල අයකිරීම් පරිගණක පද්ධතිය තුලින් තොරතුරු ලබාගත නොහැකි බැවින් හිඟ ආදායම රු.29,184,493 ක් මත පදනම්ව ගෙවා තිබු රු.1,495,225 ක දීරිදිමනා ගෙවීම් සනාථ කිරීමට තොරතුරු සහ දත්ත ඉදිරිපත් නොවිය. | සියළුම තොරතුරු යාවත්කාලීනව ලබාගත හැකි අයුරින් පද්ධතිය පවත්වාගත යුතුය. | පෙර වර්ෂ වලට අදාළ තොරතුරු වෙන වෙනම පරිගණක තොරතුරු පද්ධතියෙන් ලබා ගැනීමට නොහැකි නිසා මෙම තහවුරු කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇත. |
| (iii) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ජුනි මස දක්වා කාලපරිච්ජේදයේ සිදුවී තිබුණු රු.40,820,190 ක වැටුප් වංචාවේ නිවැරදි වටිනාකම තහවුරු කර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා නගර සභාවේ මූල්‍ය අරමුදලට සිදුවී තිබෙන මූල්‍යමය අලාභය තීරණය කළ නොහැකි විය. | වංචා සහ වැරදි අනාවරණය කරගත හැකි අයුරින් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම හා අවශ්‍යතාවයන්ට අනුව පොත්පත් හා වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යාම කළමනාකරණයේ වගකීම වේ. | මේ සම්බන්ධව විමර්ශනය කරන මෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් හා විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා සිටින ලදී. මෙම වංචාවෙහි අගය මෙතෙක් ඔබ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විමර්ශනයේදී හදුනා ගන්නා ලද අගය පමණක් වේ. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති ,රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ.756(1) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | 2018 වර්ෂයට අදාළ වාර්තාව මාස 03 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදය | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂාව සිදුකරමින් පවති. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක ,උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (I) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාල අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව එම චක්‍රලේඛයේ නම් නොකල නිලධාරින් 12 ක් සදහා සභා තීරණ මත රු.4,000 මාසික සන්නිවේදන දිමනා අනුමත කර ගෙවීම් කර තිබුණි | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මහා නගර සභා අඥාපනතේ 40 (1) ආ සාමාන්‍ය බලතල යටතේ මහා සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාළ ගෙවීම් සිදුකර ඇත. |
| (ඉ) | උතුරු මැද පළාත් | කඩකාමර අතුරු බදු දීම් | චක්‍රලේඛ උපදෙස් | මෙ සම්බන්ධව විමර්ශන |

| | | | | |
|---|---|---|---|---|
| | පාලන කොමසාරිස්ගේ 1994 ජුලි 18 දිනැති අංක LG/09/07/19 චක්‍රලේඛයේ 07 ඡේදය | සම්පූර්ණයෙන් තහනම් වුවද පොදු වෙළඳපල පළමු අදියර බිම් මහලේ කඩකාමර 18 ක් දෙවන අදියර කඩකාමර 68 ක් අතුරු බදුදී තිබුණි. | ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | සිදු කරමින් පවතී. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>----------------------<br>2.9.1 ඡේදය | වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ මිලගණන් කැඳවා මිලදී ගැනිම සිදු කිරිමට අදාලව රැස් වූ ප්‍රසම්පාදන කම්ටුවල සාමාජිකයන් 40 දෙනෙකුට රු.662,644 ක මුදලක් ගෙවීම් සිදුකර තිබුණි. | චක්‍රලේඛය අනුව මුදල් අයකර ගත යුතු වේ. | අනුරාධපුර මහා නගර සභාව මහා නගර සභා ආඥාපනතේ 229 වන වගන්තිය යටතේ ටෙන්ඩර් පිළිබඳ පනවා ඇති කොන්දේසි ප්‍රකාරව මහා නගර සභාව මෙතෙක් කටයුතු කර ඇත. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
---------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 04 දිනැති අංක NCP/LG/09/07/19 දරන චක්‍රලේඛය මගින් ආදායම් රැස් කිරීම මත දිරි දිමනා ගෙවීම සදහා ප්‍රාදේශීය සභාවන්ට පමණක් අනුමැතිය ලබාදි තිබුණද නගර සභාවට අදාල නොවන උක්ත චක්‍රලේඛය පදනම්ව රු.5,036,588 ක දිරිදීමනා ගෙවා තිබුණි. | අවිධිමත් දිරිදිමනා ආපසු අයකර ගත යුතුවේ. | මහා නගර සභා ආඥාපනතේ 40 (1) ආ සාමාන්‍ය බලතල යටතේ මහා සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාළ ගෙවීම් සිදුකර ඇත. |
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 266 අ වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබානොගෙන වර්ෂය ආරම්භයේ පැවති රු.3,654,582 ක් වූ ආදායම් විෂයයන් 8 ක ලැබිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂයේදි මූල්‍ය ප්‍රකාශනවලින් කපාහැර තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව සභාවට ලැබිය යුතු ආදායම් පොත් වලින් කපා හැරීම නොකල යුතු වේ. | ආදායම් උපලේඛන සකස් කිරිමේදි අවබෝධ කර ගැනීමේ දෝෂයක් හේතුවෙන් මෙම ලැබිය යුතු ආදායම් ගිණුම් වලින් කපා හැරිම් සිදු කර ඇත. එය ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | නියෝජ්‍ය නගරාධිපතිවරයාට ඉන්ධන දීමනාවක් ලබාදීම සඳහා නෛතික ප්‍රතිපාදන නොතිබියදී 2018 අප්‍රේල් මස | බල රහිත ගෙවීම් වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු | මහා නගර සභා ආඥාපනතේ 40 (1) ආ සමාන්‍ය බලතල යටතේ මහා සභාව වෙත පැවරි ඇති |

| | | | |
|---|---|---|---|
| | සිට දෙසැම්බර් මාසය දක්වා මසකට ඩීසල් ලීටර් 200 බැගින් ඩීසල්ලීටර් 1800 සඳහා රු. 171,000 ක දීමනාවක් ගෙවා තිබුණි. | කල යුතුය. | බලතල ප්‍රකාරව සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාළ ගෙවීම් සිදුකර ඇත. |
| (ඈ). | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව නගරාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලේකම්ට රු.15,000 ක හා මහජන සම්බන්ධීකරුට රු.10,000 ක උපරිමයකට යටත්වන මුදලක් මාසිකව ගෙවිය හැකි වුවත් සභාව විසින් පෞද්ගලික ලේකම්වරයාට රු.20,000 ක් හා මහජන සම්බන්ධිකරුට හා රු.15,000 ක් බැගින් ගෙවිම නිසා වර්ෂයට රු.90,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | බල රහිත ගෙවීම් වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මහා නගර සභා ආඥාපනතේ 40 (1) ආ සමානා බලතල යටතේ මහා සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාළ ගෙවීම් සිදුකර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,113,853 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,677,445 ක් විය.

2.2 මූල්‍ය පාලනය
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවට රෝද 04 ට්‍රැක්ටර් 03 ක් සහ අශ්ව බල 30 හා 120 එක්ස්කැවේටර් යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.20,000,000 ක් වූ ණය මුදලින් රු.9,707,000 ක් වැයකර ට්‍රැක්ටර් 03 ක් හා අශ්ව බල 30 එක්ස්කැවේටර් යන්ත්‍රයක් පමණක් මිලදී ගෙන තිබුණු අතර ඉතිරි රු.10,293,000 ක ණය මුදල යොදවා අශ්ව බල 120 එක්ස්කැවේටර් යන්ත්‍රය මිලදී | නිශ්චිත අරමුණු සඳහා ලබාගෙන තිබුණු ණය අදාල කාර්යය සඳහා භාවිතා නොකිරිම සම්බන්ධව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් නැවත පියවීමේ අරමුණින් මෙම මුදල් පුනරාවර්තන වියදම් සඳහා දරා ඇත |

නොගෙන පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණු බව අනාවරණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 65,000,000 | 65,001,600 | 66,479,382 | 8,107,309 | 65,500,000 | 68,552,914 | 63,301,193 | 90,919,302 |
| කුලී | 24,650,000 | 23,627,664 | 14,386,113 | 42,650,051 | 24,650,000 | 25,332,031 | 19,906,664 | 47,135,639 |
| බලපත්‍ර ගාස්තු | 15,000,000 | 14,967,545 | 151,417,176 | 2,199,994 | 15,000,000 | 15,632,224 | 14,698,340 | 3,133,877 |
| වෙනත් ආදායම් | 32,500,000 | 30,429,416 | - | 62,947,120 | 32,500,000 | 40,573,246 | 74,615,304 | 28,905,061 |
| එකතුව | 137,150,000 | 134,026,225 | 232,282,671 | 115,904,474 | 137,650,000 | 150,090,415 | 172,521,501 | 170,093,879 |

විගණනයට ඉදිරිපත් කර තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම් , බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිග ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. | වසර 05 කට වරක් දේපළ තක්සේරු කිරීමටත්, අතර කාලපරිච්ඡේදයේ වරිපනම් ඒකක සංවර්ධන සහ වෙනස් කිරීම් හදුනාගෙන බදු අයකිරිමට කටයුතු කල යුතු වේ. | මේ වන විට නව තක්සේරුවක් 2020ට අදාළව කැඳවීමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු රු.90,919,303 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මහ නගර සභා අඥා පනත අනුව කටයුතු කල යුතු වේ. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිගහිටි කඩකුලී රු.41,209,176 | හිඟකුලී අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

ක් සහ හිඟහිටි නිවාස කුලී රු.2,785,093 ක් අයකර ගෙන නොතිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ස්ථානවලින් රු.3,133,878 ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | බලපත්‍ර ගාස්තු අයකර ගැනිමට කටයුතු කල යුතු වේ. | හිඟ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.701,645 ක් හා මුද්දර ගාස්තු රු.28,203,417 ක් විය. | ලැබිය යුතු සියළුම උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන නිවැරදිව ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරිමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබදව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 34 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කල යුතු වේ. | මේ වන විට අතුරු ව්‍යවස්ථා 50ක් කෙටුම්පත් කර සාකච්ඡා කරමින් ඇත. කඩිනමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී |

(ආ) පාරිසරික ගැටළු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව නගර සභාව විසින් පෞද්ගලික ආයතනයකට ලැගුම්හල් මට්ටමේ කාමර පවත්වාගෙන යාමට මල්වතුඔය අසල භූමිය බදු දී තිබූ අතර බදුකරු විසින් අදාළ භූමියේ කාමර 20 ක් පමණ ඉදිකර දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා කාමර පහසුකම් සපයා මුදල් අයකරමින් තිබුණි. | මල්වතුඔය සහ රක්ෂිතය තුල සියළුම අනවසර ක්‍රියාකාරකම් නවතා දැමීමට කටයුතු කලයුතු වේ. | මේ පිළිබඳ පරික්ෂාකර කඩිනමින් අදාල ක්‍රියා මාර්ග ගන්නා ලෙස අදාළ නිළධාරින්ට නියෝග කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කීරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ PD-120 දරන එක්ස්කැවේටර් යන්ත්‍රය ගිනි ගැනීම සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශනය අනුව අනුව හඳුනාගත් රු.මි.3.3 ක අලාභයෙන් හතරෙන් එකක් වන රු.825,000 ක් නාගරික කොමසාරිස්,ඉංජිනේරු, ගණකාධිකාරි,පරිපාලන නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක පරීක්ෂක යන නිලධාරීන්ගෙන් සමානුපාතිකව අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද එම මුදල අදාල නිලධාරීන්ගේ අයකර නොතිබුණි. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මේ සම්බන්ධ විනය නියෝගයන් නිකුත්ව නැත. |
| (ආ) | ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 1.1 වගන්ති ප්‍රකාරව උපලේඛනගත නිවසක් වන නාගරික කොමසාරිස්වරයාට වෙන්කර තිබුණු උපලේඛනගත නිවාසයෙහි පදිංචිව සිටින හිටපු නාගරික කොමසාරිස්වරයා 2016 ජූනි මස සිට | ආයතන සංග්‍රහයේ වගන්ති ප්‍රකාරව කටයුතු කිරිම පැහැර හැරීම සම්බන්ධව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් කුලී සහ දණ්ඩන කුලී අයකර ගැනීමටත් විනයානුකූල | වර්තමාන නාගරික කොමසාරිස්වරයා නගර සීමවා තුළ පිහිටි පළාත් සභාව සතු නිල නිවසක රැඳී සිටීමත්, හිටපු නාගරික කොමසාරිස්වරයා මහා නගර සභාව සතු නිල නිවසක රැඳි සිටීමත්, හා මෙම නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | අනුරාධපුරය මහා නගර සභාවෙන් ස්ථාන මාරුවී ගොස් ඇතත් 2019 ජුනි මාසය දක්වා උපලේඛනගත නිවසින් ඉවත් වී ගොස් නොතිබුණි. නියමිත කාලය ඉක්මවා සිටි කාල පරිච්ජේදයේ වෙනුවෙන් දණ්ඩන කුලී අය කිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කටයුතු කිරිමටත් පියවර ගත යුතුය. | දෙදෙනාගේම එකඟතාවය, මත සිදුකර ඇත. |
| (ඇ) | ස්ථිර හා අනියම් සේවකයින් 532 කින් සමන්විත කාර්ය මණ්ඩලයේ වැටුප් සැකසීම සඳහා භාවිතා කර තිබුණු රාජ්‍ය වැටුප් සැකසීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී දත්ත සමුදාය විධිමත්ව පරිපාලනය නොකිරීම, පද්ධතියට පුද්ගල නාම මූලික වැටුප් ඇතුළත් කිරීමේ යෙදවුම් පාලනය නොකිරීම උපුටා ගැනීම් සඳහා බලය නොපැවතීම හා ආරක්ෂා නොකිරීම සහ පුද්ගල වැටුප් ලේඛන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ලේඛණය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබීම නිසා රු.40,852,190 ක වැටුප් වංචාවක් සිදුවී තිබුණු අතර මෙම මූල්‍ය අක්‍රමිකතාවයට වගකිවයුතු පාර්ශ්වයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියළුම පරිගණක පද්ධතිවල දත්ත සමුදායන් විධිමත්ව පාලනය කිරීම, පද්ධතියට දත්ත යෙදවුම් සහ කපාහැරීම් බලය පාලනයට යටත් කිරීම, අභ්‍යන්තර පාලන පද්ධතීන් යාවත්කාලීන කිරීම සහ පොත්පත් ලේඛන සහ වාර්තා පවත්වා ගැනීම සභාවේ වගකීමකි. මෙම වැටුප් වංචාව සම්බන්ධව වගකිව යුතු පාර්ශ්වයන්ට එරෙහිව කටයුතු කළයුතු වේ. | මේ වන විට වැටුප් සකස් කිරිමේදී විධිමත් පාලන ක්‍රමයක් අනුගමනය කරන බව දන්වමි. වැටුප් පාලන ගිණුම් සැකසීම හා වැටුප් ලේඛනය පවත්වාගෙන යාම ආදී පාලන ක්‍රමයන් වැටුප් සැකසීමේදී භාවිතා කරනු ලබයි. තවද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලේඛන, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලේඛන මෙතෙක් නඩත්තු නොකළ අතර ඉදිරි මාසයේ සිට නඩත්තු කරන බව දන්වමි. |
| (ඇ) | හිටපු නාගරික කොමසාරිස්වරයකු නිල නිවසේ පදිංචිවීම වෙනුවෙන් 2009 සැප්තැම්බර් සිට 2015 ජුනි දක්වා ගෙවල් කුලී රු.205,750 ක් අයකරගෙන නොතිබුණි. 2009 ඔක්තෝබර් 13 දින සභා තීරණයක් මත නාගරික කොමසාරිස්වරයාට කුලී ගෙවීමකින් තොරව අවසර දී තිබුණි. | 2009 සැප්තැම්බර් මස සිට 2016 ජුනි මස දක්වා හිග ගෙවල් කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මහා නගර සභා ආඥාපනතේ 40 (1) ආ සමාන්‍ය බලතල යටතේ මහා සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාල ගෙවීම් සිදුකර ඇත. |
| (ඉ) | ගෙවිය යුතු බිල්පත් කාලීනව නිරවුල් නොකිරීම නිසා බිල්පත් මත ගෙවීම්කර තිබුණ වැට් බදු මුදල් | බිල්පත්‍ර කාලීනව නිරවුල් නොකිරිම සම්බන්ධව වගකිව යුතු | මහා නගර සභාව විසින් ගෙවීමක් සම්පූර්ණ කිරිමට මුදල් කාරක සභාව වෙත යොමු කර |

| | | |
|---|---|---|
| රු.1,011,953 ක් මහා නගර සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන වැට් බද්දෙන් හිලවු කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමිවී තිබුණි | පාර්ශ්වයන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | එම අනුමැතිය ලබා ගෙන ගෙවීම් කිරිමේදී මාසයක් ඉක්ම වූ කාලයක් ගත වන බැවින් මෙම තත්ත්වය උද්ගතව ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රථමික මට්ටමේ තනතුරු 10 ක පුරප්පාඩු 110 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 16 ක පුරප්පාඩු 59 ක්, තෘතියික මට්ටමේ තනතුරු 2 ක පුරප්පාඩු 2 ක් හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක පුරප්පාඩු 2 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | අනියම් හා දීමනා සේවකයන් 166 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර ඔවුන් නිත්‍ය සේවකයන් අවශ්‍ය තනතුරු 24 ක වැඩ බැලීම සඳහා යොදවා ගෙන තිබුණි. පුරප්පාඩු ඇති බව සඳහන් කරමින් අනියම් පදනම මත අඛණ්ඩව සේවකයන් බඳවා ගෙන තිබීම නිසා උත්පාදනය කර තිබුණු රු.293,031,093 ක ආදායමින් රු.93,599,719 ක් වූ සියයට 31.5 ක් අදාල අනියම් කාර්ය මණ්ඩල වැටුප් දීමනා ගෙවීම සඳහා වැයකර තිබුණි. | අවශ්‍ය වන කාර්යය මණ්ඩලයක් අනුමත කරවා ගෙන බඳවා ගැනිමට කටයුතු කිරිමෙන් සභාවේ වැටුප් පිරිවැය අවම කරවා ගැනිමට කටයුතු කල යුතු වේ. | අවශ්‍ය කාර්යමණ්ඩලය අනුමත කර දීමට කටයුතු කර නොමැත. අවම වශයෙන් පුරප්පාඩු හෝ සම්පූර්ණ කර දී නොමැත. ඒ හේතුව නිසා මෙම තත්වය පැන නැගී ඇත. |

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවකයන් 495 දෙනෙක් සඳහා T-shirt ලබාදීම වෙනුවෙන් රු.371,250 ක් වැය කර තිබුණි. | සේවකයින්ගෙන් මුදල් අයකර ගැනිමට කල යුතු වේ. | සභා අනුමැතිය පරිදි මෙම වැය දරා ඇත. |
| (ආ) | පලාත් පාලන කොමසාරිස්ගේ 2011 ජුනි 08 දිනැති අංක 01/2011 දිනැති චක්‍රලේඛයේ 3.2 (අ) ඡේදය පරිදි ඇස්තමේන්තුගත ආදායමින් සියයට 80 ක් එකතු කිරීමෙන් පසු එකතු කරනු ලබන ඉතිරි සියයට 20 ක ප්‍රමාණය මත සියයට 5 ක් නොඉක්මවන ප්‍රමාණයක් පමණක් | අදාල සේවකයින්ගෙන් මුදල් අයකර ගැනිමට හෝ ගෙවීම් සහතික කල අනුමත කල සහ ගෙවීම් කල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කල යුතු වේ. | මෙම දිරි දිමනා ගෙවීම් කර ඇත්තේ 80% ඉක්මවා ඉපයු 20% ආදායමට අමතරව 100% ඉක්මවා අයකරන ලද ඉතිරි මුදල සඳහා ද අදාළ දිරිදීමනාව 01/2011 චක්‍රලේඛයේ දිරිදිමනා ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයක් |

| | | |
|---|---|---|
| දිරි දීමනා ගෙවිය හැකි වුවත් 2018 වර්ෂයේ වෙනත් ආදායම විෂයයන් 04 ක රු.20,600,000 ක ඇස්තමේන්තුගත ආදායමින් 20% උපරිමය වන රු.4,120,000 පදනමව 5% ක් වූ රු.206,000 දිරි දීමනාවක් වෙනුවට රු.780,395 ගෙවීම කර තිබුණු බැවින් රු.574,395 ක වැඩියෙන් ගෙවා තිබුණි. | | නගර සභා සේවකයින් සඳහාද ගෙවීමට මුදල් කාරක සභා තීරණය හා මහා සභාවට ඉදිරිපත් කිරිමෙන් පසුය. |

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 පවරා නොගත් වත්කම්

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව සතු, හඳුනාගත් වාහන 15 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය නගර සභාවට පවරා ගැනිමට පියවර ගත යුතුය. | පවරා ගැනීමට කටයුතු කරමි |

3.6 හඳුනාගත් පාඩු

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 ජුලි 14 සභා යෝජනා අංක 4 7(2) ට අනුව කාර්යාල සංකීර්ණයවල කුලි වෙනස් නොකර 1999 නොවැම්බර් 19 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණු තක්සේරුවට 2004 ජනවාරි සිට කුලි අයකිරිමට තිරණය කර තිබුණද ආයතන 3 කින් ඊට .අඩු මුදලකට කුලී අයකර තිබීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට රු.8,892,000 ක මූල්‍යමය පාඩුවක් වී තිබුණි. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අඅයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | නිරීක්ෂණයට අදාලව පිළිතුරු සපයා නැත. |
| (ආ) | අනුරාධපුර මහා නගර සභාවේ සේවය කළ කාර්යාල කාර්ය සහායකවරයකු 2013 අගෝස්තු 19 දින සිට පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත | අදාල කාර්යාල කාර්ය සහායකවරයාගෙන් හෝ නොසැලකිලිමත් ලෙස කටයුතු කල පාර්ශ්වයන්ගෙන් හෝ | ආපසු අය කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාන මාරු වී ගොස් තිබුණු නමුත් 2013 සැප්තැම්බර් මස සිට 2018 ජූනි මාසය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු.1,816,557 ක මුදලක් මහා නගර සභාව විසින් වැටුප් සහ දිමනා ලෙස ගෙවා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | |
| (ඇ). | 2016 පෙබරවාරි 25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික වැටුප් පරිවර්තනයන් නිවැරදි සිදු නොකිරීම හේතුවෙන් විගණනයේදී හඳුනාගත් සේවකයන් 11 දෙනකු වෙත 2017/2018 කාලපරිච්ඡේදයේදී රු.231,190 ක වැටුප් අධි ගෙවීම් සිදුකර තිබුණි | අධි වැටුප් ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | වැඩිපුර ගෙවීම් ආපසු අය කිරීමට කටයුතු කරමි. |

3.7 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයිම් කමිටු සඳහා සහභාගි වීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදි එම කමිටුවලට සහභාගි නොවූ නිලධාරින් 11 ක් වෙනුවෙන් රු.97,250 ක දීමනා ගෙවා තිබුණි. | සහභාගීත්වය සනාථ නොවන පාර්ශ්වයන්ට කර තිබෙන ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මහා නගර සභා ආඥාපනතේ 229 වන වගන්තිය යටතේ ටෙන්ඩර් පිළිබඳ පනවා ඇති කොන්දේසි ප්‍රකාරව මහා නගර සභාව මෙතෙක් කටයුතු කර ඇත. සභාව විසින් ගන්නා ලද සභා තීරණ මත අදාල ගෙවීම් සිදුකර ඇත. |

3.8 ප්‍රසම්පාදනය

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

3.8.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | ------------- | ------------------------------------ |
| මහා නගර සභා භූමියෙහි හෙල බොජුන්හලක් ඉදිකිරීම සඳහා රු.3,233,480 ක ඇස්තමේන්තුවක් මත රු.3,226,499 කට තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුට ලබානොදෙමින් රු.5,896,935 ක්වූ වෙනත් ඉදිකිරීම් ඇස්තමේන්තුවක් පදනම්ව වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට එම ඉදිකිරීම පවරාදී කර්මාන්තය නිම කිරීමෙන් පසුව නිමි වැඩ වටිනාකම රු.5,423,215 ක් ලෙස සහතික කර ගෙවීම් සිදුකර තිබීම නිසා රු.2,189,735 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි. | අදාල මූල්‍ය පාඩුව සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන් එරෙහිව කටයුතු කළයුතු වේ. | පූජා නගරයට සැලසුම් කරන ලද හෙළ බොජුන්හලේ ඉඩ කඩ නගර සභාවේ ඉදිවීමට යෝජිතව තිබූ (නගර සභා ආපන ශාලාව) ඉඩ කඩ ප්‍රමාණයකට වඩා වැඩිපුර ඉඩ ප්‍රමාණයකින් යුක්ත විය. නමුත් එම ඉදිකිරිම පූජා නගර කමිටුවට ඉදිරිපත් කර තිබූ විරෝධතාවයක් නිසා අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම අත්හිටුවන ලද අතර එම සියළු අවශ්‍යතාවයන්ම සපිරෙන පරිදි නගර සභා භූමිය තුළ ඉදිකිරිමට යෝජිතවූ භෝජනාගාරය වෙනුවට හෙළ බොජුන්හල ඉදිකර අවශ්‍යතාවයන් දෙකම ඉටුකර ගැනීමට තීරණය කරන ලදි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම
-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | ------------- | ------------------------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | විගණනකළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරිමට සටහන් කර ගතිමි. |

4.2 පිළිතුරු සපයා නොමැති විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016,2017,2018 වර්ෂවලට අදාල අනුරාධපුර මහනගර සභාවට නිකුත්කල රු.155,472,791 ක ගණනය කලහැකි මුල්‍යමය වටිනාකමක් පවතින විගණන විමසුම් 27 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් වලට පිළිතුරු ඉදිරිපත් කල යුතු වේ. | විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි විගණන විමසුම් 27 සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාද වී ඇති බව පිළිගනිමි. |